wsws.org

World Socialist Web Site

Published by the International Committee of the Fourth International

# හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ පනස් වන සංවත්සරයේ දී ඩේවිඩ් නෝර්ත් ශ්‍රී ලංකාවේ ට්‍රොට්ස්කිවාදීන් අමතයි

**වාර්තාකරුවෙකු විසිනි**
**2003 නොවැම්බර් 21**

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (හජාජාක) පිහිටුවීමේ අඩසියවස් සංවත්සරය නිමිත්තෙන් නොවැම්බර් මස 16 දා සමාජවාදී සමානතා පක්ෂය (සසප) කොලඹ දී පැවැත්වූ රැස්වීම ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ) ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සභාපති ඩේවිඩ් නෝර්ත් විසින් අමතනු ලැබින. රැස්වීම පැවැත්වූයේ හදිසි නීතිය ප්‍රකාශ කිරීමට ජනාධිපති කල තර්ජනයෙන් ප්‍රකුපිත කෙරුනු දේශපාලන අර්බුදයක් මධ්‍යයේ ය.

කොලඹින් මෙන් ම, උතුරේ එල්ටීටීඊ පාලිත වන්නි ප්‍රදේශයෙන් ද යාපනයෙන් ද මධ්‍යම පලාතේ මහනුවර, හැටන් හා බන්ඩාරවෙලින් ද දකුනේ හික්කඩුව හා අම්බලන්ගොඩින් ද පැමිනි සාමාජිකයන් හා නියෝජිතයෝ රැස්වීමට එක් වූහ. හජාජාක ප්‍රතිපත්ති හා ඉතිහාසය පිලිබඳව පුලුල් වාර්තාවක් ඉදිරිපත් කල ඩේවිඩ් නෝර්ත් වෙත, සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස් විසින් පක්ෂයේ උනුසුම් සුබ පැතුම් පිරිනැමුනි. නෝර්ත්ගේ වාර්තාව සිංහලට හා දෙමලට පරිවර්තනය විය.

හජාජා කමිටුවෙහි අද්විතීය වාර්තාව පෙන්වා දෙමින් කතා කල නෝර්ත්, "අද දවසේ ලෝකයේ වෙනත් කුමන දේශපාලන සංවිධානයක් සිය සමස්ත ඉතිහාසය සමීක්ෂනය කිරීමටත් සිය වත්මන් භාවිතාව තමන් සැබෑ වසයෙන් ආරම්භයේ දී පදනම් වූ මූලධර්ම හා පරමාදර්ශයන්ට සම්බන්ධ කරලීමටත් සමත් වන්නේ දැ"යි විමසී ය.

ව්‍යවස්ථා අර්බුදය හමුවේ රටේ පාලක කවයන් තුල පවතින වික්ෂෝභය නෝර්ත් විසින් සටහන් කෙරුනි. කෙසේ වුව ද, කොලඹ පුවත්පතක ශීර්ෂ පාඨය, "සිහිවිකල් වූ හා මුලාවට පත්" යන කොටස ලංකාවේ ආන්ඩුවට මෙන් ම බුෂ් පරිපාලනයට ද එක සේ යෙදිය හැකි බව ඔහු ප්‍රකාශ කලේ ය.

පෙර නො වූ විරූ ආයුධ ගබඩාවක් සතුව තිබුන ද, එය ම පමනක් එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අර්බුදය නො විසඳනු ඇතැයි ඔහු කී ය. "සිය කෲරත්වයෙන් හා මුග්ධත්වයෙන් ජෝර්ජ් බුෂ් විසින් මූර්තිමත් කෙරෙන්නේ එක්සත් ජනපද පාලක ප්‍රභූව තුල පවතින ප්‍රායෝගික හා බුද්ධිමය බංකොලොත්කම යි. පසු ගිය මාර්තුවේ දී, ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කරමින් යුද්ධයක් දියත් කෙරුනේ මුසාවාද හා නො මග යැවීම් මත පදනම් වෙමිනි. ඒවා ගැඹුරින් ම හෙලිදරව් වී තිබේ."

"මාධ්‍ය කියනු ලැබෙන ඕනෑම දෙයක් සත්‍ය ය යි ද ඓතිහාසික පාඩම් නො තකා හැරීම මත සිය ප්‍රතිපත්ති විස්තාරනය කල හැකි ය යි ද ඇමරිකානු පාලක පන්තිය විශ්වාස කරන" බව නෝර්ත් පැහැදිලි කලේ ය. "එහෙත් මුග්ධත්වයට හා මුසාවාදයට එරෙහිව ඉතිහාසය හා සත්‍යය සිය පලිය ගැනීම නො වැලැක්විය හැකි ය."

ලොව පුරා සමාජ ආතතීන් ගිනියම් කෙරෙන, ලෝක ආර්ථිකයේ වෛෂයික ප්‍රතිඝතිතතාවන් කථිකයා විසින් පෙන්වා දෙනු ලැබුනි. නිෂ්පාදන බලවේගයන්ගේ භූගෝලීය වර්ධනය ජාතික රාජ්‍යයේ රාමුව හා පෞද්ගලික හිමිකම සමග අසංගතව පිහිටා ඇත. භූගෝලීය නිෂ්පාදන ක්‍රියාවලිය තුලට ආසියාව ඒකාග්‍ර කිරීම පිටුපස අත්‍යසාමාන්‍ය තාක්ෂනික සංවර්ධනයන් පැවති නමුත්, එයින් පල නෙලා ගැනී ඇත්තේ ජනගහනයෙන් අල්පතරයක් විසින් පමනි.

ලෝක අර්බුදයේ වඩාත් ඒකාග්‍රිත ප්‍රකාශනය දැකගත හැක්කේ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ පුපුරා යාම තුල බව නෝර්ත් කියා සිටියේ ය. එක්සත් ජනපද ආධිපත්‍යය යටතේ ධනවාදය ප්‍රතිසංවිධාන කිරීමේ හා ස්ථාපිත කිරීමේ උමතු උත්සාහයෙහි අපේක්ෂා කවරේදැයි ඔහු විමසී ය. දැනට මත් ඉරාකය තුල පවතින විරෝධතාවන් ගරිල්ලා සටන්වල හා ත්‍රස්ත ක්‍රියාවන්හි ප්‍රාථමික රූපාකාරය ගෙන තිබෙන්නේ වී නමුදු, පැහැදිලි දේශපාලන ක්‍රියා මාර්ගයක් හා ඉදිරි දර්ශනයක් අවශ්‍ය කරන නව කම්කරු පන්තික පෙල ගැසීමක් ද පැන නැංවෙනු ඇත.

කම්කරු පන්තිය මුහුන පාන දේශපාලන ගැටලු ආගමික මූලධර්මවාදයේ හෝ ස්වෝත්තමවාදයේ පදනම මත විසඳිය නො හැකිවාක් මෙන් ම, ත්‍රස්තවාදී ක්‍රම මගින් අධිරාජ්‍යවාදය පරාජය කල නො හැකි බව ද නෝර්ත් අවධාරනය කලේ ය.

"අපි කම්කරු පන්තියේ ශක්තිය මත පදනම් වන්නෙමු. සැඟවී ගත් කුඩා කන්ඩායම් ලෙස වැඩ කරන, හුදෙකලා කුමන්ත්‍රනකරුවන් විසින් දැවැන්ත දේශපාලන ගැටලු නො විසඳෙනු ඇත. අවශ්‍ය වන්නේ පලල් ජනතාවගේ දේශපාලන සංස්කෘතිය හා දැනුවත් භාවය නංවාලීම යි. කම්කරු පන්තිය ව්‍යාකූලත්වයට හෙලන, අවමංගත කිරීමට මං සලසන හා එය

ගසා කනු ලබන ත්‍රස්ත සංවිධානවලට අප සම්මුති විරහිතව විරුද්ධ වන්නේ එබැවිනි.

"ත්‍රස්තවාදී සංවිධාන විසින් කම්කරු පන්තියේ හා ගොවි ජනතාවගේ පීඩිත කොටස්වල අවශ්‍යතාවන් නියෝජනය කරන ක්‍රියා මාර්ගයක් සම්පාදනය කිරීම කෙසේ වෙතත් මහජනතාවන් ඇමතීම වත් නො කෙරෙන බව සටහන් කර ගත මනා ය. කම්කරු පන්තියට එහි ඓතිහාසික අරමුනු අවබෝධ කරවන දේශපාලන ක්‍රියා මාර්ගයක් කා වැද්දීමට තැත් කිරීමෙහි ප්‍රතිගාමී ප්‍රතිවාදය වන්නේ කාර් බෝම්බය යි. අල්කයිඩා හා එවන් සංවිධානවල ත්‍රස්තවාදී ක්‍රමවේදයන් පැන නගින්නේ ඔවුන් විසින් ජාතික ධනේශ්වරයේ කලකිරීමට පත් කොටස් නියෝජනය කරනු ලැබීමේ කරුනෙනි. ඔවුන්ගේ ක්‍රියාවන් මගින් නියෝජනය වනුයේ පවත්නා බල ව්‍යුහය ප්‍රතිසංවිධාන කිරීම සඳහා වූ ඔවුන්ගේ දිගු කාලීන ගනුදෙනු තුල පවත්නා බොහෝ කේවෙල්කාරකයන් ය.

"අහිංසක ජනතාව ඝාතනය කරන ත්‍රස්තවාදී ප්‍රහාර කම්කරු පන්තිය දේශපාලනිකව උගන්වා ගැනීමේ ක්‍රියාවලියට හරස්ව පිහිටන අතර, එය කඩාකප්පල් කරයි. ධනේශ්වර රාජ්‍යයේ වඩාත් ප්‍රතිගාමී බලවේගයන්ගේ අත ශක්තිමත් කරන ඔවුහු තුමු ම පහසුවෙන් පොලිසියේ හා ඔත්තු සේවාවන්හි හැසිරවීමට ලක් වෙයි. ඉස්තාන්බුල්හි යුදෙව් ධර්ම ශාලා දෙකක් අසල බෝම්බ ඇටවීමෙන් හෝ රියාද්හි කම්කරු නිවහන්වලට බෝම්බ දැමීමෙන් වාසි ලැබුවෝ කවරහු ද? ඉරාක යුද්ධයට තුර්කිය තුලින් මතු වී ඇති විරුද්ධත්වයකට එක්සත් ජනපදය මුහුන දී සිටින තත්වය තුල අහිංසක ජනතාව මරා දමන බෝම්බ ඉස්තාන්බුල්හි පුපුරා යයි."

**හතර වන ජාත්‍යන්තරයේ පදනම**

හතර වන ජාත්‍යන්තරයේ ඉතිහාසය දෙසට හැරෙමින් නෝර්ත් කියා සිටියේ, ජාත්‍යන්තර කමිටුව පසු ගිය අඩසියවසක කාලය තුල සියලු වර්ගවල දේශපාලනික මවා පෑම්වලට එරෙහිව සම්මුති විරහිත අරගලයක යෙදී සිටිය බව යි.

"පසු ගිය පනස් වසරෙන් වැඩි කොටසක් පුරා, විප්ලවවාදී මාක්ස්වාදයට විකල්පයක් ලෙස විවිධ සංවිධාන උත්කර්ෂයට නංවමින් සංශෝධනවාදීන් ද පැබ්ලෝවාදීන් ද විසින් අපගේ ව්‍යාපාරය ඓතිහාසිකව මුල් බැස ඇති ක්‍රියා මාර්ගය අවඥාවට ලක් කෙරෙනු අපි අසා ඇත්තෙමු. එහෙත් අපගේ සියලු විවේචකයන් දැන් පැමින සිටින්නේ කොතැනට ද?

"අපගේ ඉතිහාසයෙහි දිග් ගැසුනු කාල පරිච්ඡේදය සමාලෝචනය කර, එහි වෛෂයික වැදගත්කම තක්සේරු කිරීම දැන් අපට කල හැකි ය. ප්‍රශ්නය මෙසේ මතු කරමු: 1953 දී ජාත්‍යන්තර කමිටුව පිහිටැවුනු මූලධර්මයන් ඓතිහාසිකව හෝ දේශපාලනිකව සනාථ වී ද? යමෙක් අඩසියවසකට පෙර දේශපාලන අරගලයේ උනුසුම මධ්‍යයේ අප පිලියෙල කල ලියකියවිලි යලි කියවන්නේ නම්, ඔහු ඒවායේ අසාමාන්‍ය පෙරදැකීම් අනාවරනය කර ගනු ඇත."

1938 දී හතර වන ජාත්‍යන්තරයත් 1953 දී ජාත්‍යන්තර කමිටුවත් ගොඩ නැගීමේ දී ගෙන ගිය ඓතිහාසික අරගලයන් නෝර්ත් විසින් සමාලෝචනය කෙරුනි. "වසර 30කට පෙර 1923 දී වාම විපාර්ශ්වය පිහිටුවූ තැන් පටන්, ස්ටැලින්වාදී නිලධරයේ වැඩී යාමට එරෙහිව සිය අරගලය ගෙන ගිය ට්‍රොට්ස්කි විසින් එහි ක්‍රියා මාර්ගික හැරීම් හා ඇඹරීම් නිර්දයව විවේචනය කරන ලදි. මාක්ස්වාදී මූලෝපායේ හා උපායන්ගේ සියලු අතිමූලික ප්‍රශ්නයක් ම, ආයාසකරව විසඳා ගනු ලැබිනි: සියල්ලට මත් වඩා සෝවියට් නිලධරයේ ජාතිකවාදී නැඹුරුවට එරෙහිව 20 වන සියවසේ සමාජ විප්ලවයෙහි ජාත්‍යන්තර ස්වභාවය.

විජිත රටවල ජාතික ධනේශ්වරයට විප්ලවවාදී ක්‍රියා කලාපයක් ඉටු කල හැකි ය යන පිලිගැනීම පිලිබඳ ට්‍රොට්ස්කිගේ ප්‍රතික්ෂේපයෙහි යුක්ති යුක්ත භාවය, 1927 වසරේ ෂැන්හයිහි දී කුවෝමින්ටෑනය විසින් කොමියුනිස්ට් කම්කරුවන් ඝාතනය කරනු ලැබීමෙන් ඛේදනීය ලෙස සනාථ විය. ජර්මනියේ දී "සමාජ ෆැසිස්ට්වාදය" යන අතිවාම න්‍යාය වෙතට කොමින්ටර්නය ගත් හදිසි පිම්මෙහි ප්‍රතිඵලය ලෙස හිට්ලර් බලයට පැමිනීම ද ඒ සමග බැඳුනු මොන ම අභ්‍යන්තර විවාදයක් වත් කොමියුනිස්ට් ජාත්‍යන්තරය තුල ඇති නො වීම ද සමාජ විප්ලවයේ ලෝක පක්ෂය ලෙසින් තුන් වන ජාත්‍යන්තරයේ පැවැත්ම නිමා වී ඇතැයි යන නිගමනය කරා ට්‍රොට්ස්කි මෙහෙයවුනි. නව ජාත්‍යන්තර පක්ෂයක් ගොඩ නැගිය යුතු විය. ජාත්‍යන්තර කම්කරු පන්තිය අත්විඳි පරාජයන්ගේ පරිමාව මගින් නව අධිරාජ්‍යවාදී යුද්ධයකට පදනම දැමී ඇති බව අවබෝධ කර ගන්නා අතර ම, මෙම පරාජයන්ගේ පරිමාව කොතෙක් වුව ද, කම්කරු පන්තිය විප්ලවවාදී පන්තිය වන්නේ ය යන්න ගැන පැවති සිය පුලුල් ඓතිහාසික ඒත්තු ගැනීම ගැන ට්‍රොට්ස්කි ශුභවාදී විය.

**පැබ්ලෝවාදයට එරෙහි අරගලය**

නෝර්ත් මීලගට 1953 හතර වන ජාත්‍යන්තරය තුල භේදයට තුඩු දුන් දේශපාලන කරුනු සමාලෝචනය කලේ ය.

"යුද්ධාවසානයේ දේශපාලන වර්ධනයන් ගන්නා වූ රූපාකාරය ට්‍රොට්ස්කි විසින් පූර්වාපේක්ෂිතව නො තිබිනැයි සංකල්පයක් දෙවන ලෝක යුද්ධාවසානයෙන් පසුව, හතර වන ජාත්‍යන්තරයේ ශාඛාවන් තුල වැඩී ආවේ ය. ට්‍රොට්ස්කි තමන්ට "ලෝක විප්ලවය" පොරොන්දු වූ බව මෙම කොටස් ප්‍රකාශ කලහ. එහෙත්, 1943-45 කාලය තුල විප්ලවවාදී නැගිට්මක් ඇති වූ නමුදු, අධිරාජ්‍යවාදයේ හා ස්ටැලින්වාදයේ ඒකාබද්ධ ප්‍රහාරයන් මගින් ට්‍රොට්ස්කිවාදී කේඩරයේ අතිමහත් කොටසක් විනාශ වීම හේතුවෙන් නැගිටීම සිදු වුයේ ස්ටැලින්වාදයේ හා ප්‍රතිසංස්කරනවාදී නිලධරයේ පාලනය යටතේ ය.

ඉතිහාසය පිලිබඳ "නරක මිනිසා" න්‍යායක් හජාජා කමිටුවට නො පැවති බව නෝර්ත් පැහැදිලි කලේ ය. "හතර වන ජාත්‍යන්තරයේ පාවා දීමට මයිකල් පැබ්ලෝ හා අර්නස්ට් මැන්ඩෙල් සූදානම් වුවා නො වේ. එක් අවධියක දී දෙදෙනා ම හතර වන ජාත්‍යන්තරය වෙනුවෙන් සැලකිය යුතු කැප කිරීම් කලහ. එයට වෙනස් ලෙස ස්ටැලින්වාදයට හා විජිත රටවල ජාතිකවාදී නායකයන්ට ඔවුන්ගේ අනුගත වීම, පශ්චාත් යුද්ධ ධනේශ්වර ප්‍රතිසමතුලනය මගින් ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය මතට ගෙන ආ දැවැන්ත පීඩනයේ නිෂ්පාදිතයක් විය.

මෙම පීඩනයන් ලංකාව තුල ප්‍රතිබිම්බනය වූයේ 1951-52 දී ලංකා සමසමාජ පක්ෂයෙන් (ලසසප) කැඩී වෙන් වුනු ස්ටැලින්වාදයට පක්ෂ කන්ඩායමක මතු වී ඒම ලෙස යි.

"ලෝක පරිමාන පන්ති සම්බන්ධතාවන්හි වෙනස් වීම්, එනම් ස්ටැලින්වාදී නිලධරයේ වැඩෙන බලපෑම හා ශක්තිය, ගොවි ජනතාව අතර ඇති වූ රැඩිකලීකරනය, නව මධ්‍යම පන්තියක නැගී ඒම, හතර වන ජාත්‍යන්තරයේ ගැටලු තුල ප්‍රතිබිම්බනය විය. එහි දේශපාලන දිශාවනතිය මත මෙම සියලු ප්‍රවනතා බල පෑවේ ය. මෙම නව ප්‍රපංචයන් කෙරෙහි නිවැරදි දේශපාලන ප්‍රතිචාරය සොයා ගත හැකිව තිබුනේ, මාක්ස්වාදී ව්‍යාපාරයේ අරගලයන්හි සමස්ත ඉතිහාසය නිර්මානාත්මකව නැවත හැදෑරීමක් තුලින් පමනකි."

ස්ටැලින්වාදී නිලධරය හා ඊර්ජිප්තුවේ නසර්, ඇල්ජීරියාවේ බෙන් බෙලා වැනි ජාතිකවාදී නායකයන් වෙතට පැබ්ලෝ හා මැන්ඩෙල්ගේ නැඹුරුව පත්ලෙහි පැවතුනේ, ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයට කම්කරු පන්තිය තුල පක්ෂ ගොඩ නැගීමේ හැකියාව පිලිබඳව පැවති ගැඹුරු අශුභවාදය බව නෝර්ත් කියා සිටියේ ය. තව ද, ඔවුහු ස්ටැලින්වාදීන් හා ධනේශ්වර ජාතිකවාදීන් වෙත ඔවුන්ට උරුම නො වූ විප්ලවවාදී ශක්‍යතාවක් පවරා දුන්හ. "මෙම ඉදිරි දර්ශනයෙන් උපුටා ගත හැකි දේශපාලන නිගමනයන් කවරේ ද? ට්‍රොට්ස්කිවාදී පක්ෂ, ස්ටැලින්වාදී පක්ෂ තුලටත් ධනේශ්වර ජාතික ව්‍යාපාර තුලටත් තෙමේ ම දිය වී යා යුතු බව යි.

"මෙම දේශපාලන පිලිවෙත විස්තාරනය කලා වූ 1951 වසර හා හතර වන ජාත්‍යන්තරය තුල දේශපාලන අරගලය පැන නැංගා වූ 1953 වසර අතරතුර දී පැහැදිලි වූයේ, මෙහි නිර්මාතෘන් අඩු වැඩි වසයෙන් ඉල්ලා සිටියේ හතර වන ජාත්‍යන්තරය දේශපාලනිකව විසුරුවා හැරීම බව ය. එක්සත් ජනපද සමාජවාදී කම්කරු පක්ෂයේ (සකප) නායක ජේම්ස් පී. කැනන් විසින් 1953 නොවැම්බර් 16 වන දා ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය වෙත විවෘත ලිපිය නිකුත් කිරීමට ද හජාජාක පිහිටුවීමට ද තුඩු දුන්නා වූ කාරනය මෙය යි."

**ලසසපයේ "අපක්ෂපාතිත්වය"**

1953 භේදය තුල කැනන්ගේ උපායන් පිලිබඳව බොහෝ විවේචන කෙරී තිබෙන බව නෝර්ත් පෙන්වා දුන්නේ ය. එනමුදු වැඩි හරියක දී ඒවා මග පෑදුයේ ප්‍රධාන කාරනය මග හැරීමට ය. විවෘත ලිපිය තුල ඉදිරිපත් කෙරුනු දේශපාලන ආස්ථානයන් වැරදි වී ද? නිවැරදි වී ද? ඔහු කැනන්ගේ ආස්ථානය ලෙස්ලි ගුනවර්ධන ඇතුලු ලසසප නායකත්වයේ ආස්ථානයන් හා එහි දේශපාලන ප්‍රතිවිපාකයන් සමග සැසඳී ය.

"ලංකාවේ ම අත්දැකීම් තුලින්, පැබ්ලෝගේ පිලිවෙතෙහි ඇගවුම් කවරේදැයි ගුනවර්ධන හොඳින් දැන සිටියේ ය. එහෙත් ඒ වෙනුවට ලංකාවේ නායකත්වය විසින් තෝරා ගැනුනේ, හතර වන ජාත්‍යන්තරය තුල ඇවිලෙමින් තිබූ අරගලය පිලිබඳව මනා අපක්ෂපාතිත්වයක ආකල්පය වැලඳ ගැනීම යි. ඒ මන්ද? ලංකාව තුල මතු වෙමින් තිබුනු සමාජ බලවේගයන්ට ලසසපයේ අනුගත වීම එයින් ප්‍රතිබිම්බනය විය. ඒ, දේශපාලනිකව මරනීය වූ සම්මුතීන් සූදානම් කිරීම යි."

කැනන් හා සකප සමග පැබ්ලෝවාදයට එරෙහි සටනට ඒකාබද්ධ වීමෙහි අර්ථය විය යුත්තේ, ස්ටැලින්වාදයට හා ධනේශ්වර ජාතිකවාදයට එරෙහි දේශපාලන අරගලය ගැඹුරු කිරීම මෙන් ම ට්‍රොට්ස්කිවාදයේ ඉතිහාසයෙන් හා ක්‍රියා මාර්ගයෙන් සාමාජිකත්වය යලි උගන්වා ගැනීම යි. "ලසසප නායකයන් මෙය දැන සිටි" බව නෝර්ත් කියා සිටියේ ය. "එහෙත් එවැන්නක් ලංකාව තුල විකසිත වෙමින් තිබූ දේශපාලන සන්ධානයන් සමග පෑහෙනුයේ කෙසේ ද? සිය පාර්ලිමේන්තු කන්ඩායම පිලිබඳ ප්‍රශ්නය තම ජාත්‍යන්තර දේශපාලන වගකීම්වලට වඩා ඔවුන්ට තීරනාත්මක වී තිබුනි.

"සැබවින් ම ඔවුන්ට ලංකාව තුල ගැටලුවලට විප්ලවවාදී ප්‍රතිචාරයක් සූදානම් කර විස්තාරනය කල හැකිව තිබුනේ ජාත්‍යන්තර ගැටලුවල පදනමේ පමනකි. ඒ වෙනුවට ඔවුන් තෝරා ගත්තේ නිෂ්ක්‍රියව හිඳීමේ ආස්ථානයකි: 'ඔව්, පැබ්ලෝගේ ආස්ථානයන් සදොස් ය. එහෙත් කැනන් ආවේගශීලීව, දේවල් සංවිධානාත්මක භේදයකට තල්ලු නො කර සිටියේ නම් වඩා හොඳ විය හැකිව තිබුනි.' "

නෝර්ත් 1953 දී කැනන් විසින් අවධාරනය කරන ලද ප්‍රමුඛ ප්‍රශ්න සමාලෝචනය කලේ ය. "ධනවාදයට එරෙහි අරගලය ජාත්‍යන්තර තලයේ දී දැනුවත්ව ගෙන යා යුතු එකකි. එක් හෝ තවත් රටක දී, ධනවාදය තීරනාත්මකව පරාජය කල නො හැකි ය. ඒ ඒ රට තුල අරගලයන් ජාත්‍යන්තර මූලෝපායකට යටත් විය යුතු ය, එයින් මග පෙන්විය යුතු ය. දේශපාලන පක්ෂ, තමන් සමාජවාදී ය යි හඳුන්වා ගන්නා පක්ෂ පවා, මෙම අත්‍යවශ්‍ය සත්‍යය ප්‍රතික්ෂේප කරන්නේ නම් ඒවා පදනමින් ම ප්‍රතිගාමී ය.

"තව ද මෙම ජාත්‍යන්තර පදනමෙහි දිග හැරෙන අරගලය දැනුවත් නායකත්වයක් ඉල්ලා සිටියි. ධනවාදයේ අර්බුදය කොතරම් තීව්‍ර වුවත්, එක් හෝ තවත් රටක ධනේශ්වරය කෙතරම් බෙලහීන වූවත් — ශ්‍රී ලංකාවේ දී මෙන් — කම්කරු පන්තියට බලයට ඒම සඳහා අවශ්‍ය වන ක්‍රියා මාර්ගයක්, මූලෝපායක් හා උපායන් ස්වයංසිද්ධව විස්තාරනය කල හැකි වෙතැයි සිතීම වරදක් වනු ඇත. සමාජවාදී විප්ලවයේ දේශපාලන නායකත්වය දැනුවත් හා විද්‍යාත්මක කර්තව්‍යයකි. 20 වන සියවසේ ප්‍රමුඛ පාඩම වන්නේ මෙය යි.

"මෙම ආස්ථානයේ සිට කැනන් 1953 දී අවධාරනය කල පරිදි, වෙනත් කිසිදු දේශපාලන පක්ෂයකට හතර වන ජාත්‍යන්තරයේ කේඩරය සඳහා ආදේශකයක් විය නො හැකි ය. ට්‍රොට්ස්කිවාදය හා පැබ්ලෝවාදී සංශෝධනවාදය අතර ප්‍රාථමික වෙනස පවතින්නේ මෙහි ය. පැබ්ලෝවාදී හතර වන ජාත්‍යන්තරයට විකල්පයන් ස්ටැලින්වාදීන් අතර ද ධනේශ්වර ජාතිකවාදී ව්‍යාපාර අතර ද සෙවීමේ නිමක් නැති උත්සාහයක නිරතව සිටියහ. මේ ආකාරයට පැබ්ලෝවාදීහු

කම්කරු පන්තිය තුල මාක්ස්වාදී කේඩරයක් ගොඩ නගා පුහුනු කිරීමේ අපගේ යුගයෙහි කේන්ද්‍රීය කර්තව්‍යය අත හැර දැමුහ."

## ඒකාග්‍රිත ලෝක ව්‍යාපාරයක්

සිය දේශනයේ අවසාන භාගයේ දී, 1961-63 අතරතුර සකප පැබ්ලෝවාදීන් සමග යලි එකමුතු වීම ද ඇතුලත් පශ්චාත් යුද්ධ කාල පරිච්ඡේදයේ අවස්ථාවාදයට එරෙහිව ජාත්‍යන්තර කමිටුව ගෙන ගිය දිග් ගැසුනු අරගලයේ මූලික කඩඉම් ලක්ෂ්‍යයන් නෝර්ත් විසින් සමාලෝචනය කෙරුනි. දේශපාලන මූලධර්මවල වියදමෙන් පාර්ලිමේන්තුවාදී උපාමාරුවල ම එල්බ සිටි ලසසපය, 1953 වසරේ දී දැරූ ආස්ථානයෙහි දේශපාලන පැතිකඩවලට ඔහු විශේෂ අවධානයක් යොමු කලේ ය. 1957 දී ලසසප නායක කොල්වින් ආර්. ද සිල්වා චීන අගමැති වූ එන් ලායි හමු වූ අවස්ථාවේ දී, මාවෝවාදීන්ගේ සිර මැදිරිවල කල් ගෙවමින් සිටි චීන ට්‍රොට්ස්කිවාදීන්ගේ ඉරනම ගැන ප්‍රශ්න කිරීමට පවා අපොහොසත් විය. 1964 දී ලසසප නායකත්වය ට්‍රොට්ස්කිවාදයේ ප්‍රමුඛ මූලධර්මයන් පාවා දෙනු ලැබ සිරිමා බන්ඩාරනායකගේ ධනේශ්වර ආන්ඩුවට ඇතුලු විය. මෙය, ඉන් පසු දශක තුනක් තුල ශ්‍රී ලංකාවේ මෙන් ම ජාත්‍යන්තර කම්කරු පන්තිය මත ද විනාශකාරී ප්‍රතිවිපාක අත් කර දුන් තීන්දුවක් විය.

බ්‍රිතාන්‍ය කම්කරු විප්ලවවාදී පක්ෂ නායකත්වයේ පසු කාලීන දේශපාලන පරිහානිය හා 1985-86 වසරවල භේදයෙන් කූලු ගැන්වුනු දේශපාලන අරගලය නෝර්ත්ගේ සාකච්ඡාවට බඳුන් විය. ස්ටැලින්වාදී නිලධරයේ ද විවිධ ජාතික විමුක්ති ව්‍යාපාරයන්හි ද මතුපිට ශක්තිය මත පදනම් වූ, ජාත්‍යන්තර කමිටුවෙන් කැඩී ගිය සියලු කන්ඩායම් වසර කිහිපයක් තුල බිඳී විසිර ගිය බව නෝර්ත් පෙන්වා දුන්නේ ය. සෝවියට් සංගමයේ බිඳ වැටීමෙන් පසුව, පලස්තීන විමුක්ති සංවිධානය වැනි ඒවා සෘජුව ම අධිරාජ්‍යවාදයට අනුගත විය. අනෙක් අතට ජාත්‍යන්තර කමිටුව 20 වන සියවසේ ඓතිහාසික පාඩම් උකහා ගැනීම හා කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය පිහිටුවීම මත ද පදනම විය. මේ ආකාරයෙන් එය පසු ගිය 18 වසර තුල අත් කර ගත් ජයග්‍රහනයන් සඳහා පදනම දැමුනි.

සමාජවාදී සමානතා පක්ෂ හා ලෝක සමාජවාදී වෙබ් අඩවිය ගොඩ නැගීම මගින් ජාත්‍යන්තර කමිටුවේ බලපෑම දැවැන්ත ලෙස ප්‍රසාරනය වී ඇති බව පෙන්වා දෙමින් නෝර්ත් සිය දේශනය සමාප්ත කලේ ය. "ජාත්‍යන්තර කමිටුව පිහිටුවීමේ 50 වන සංවත්සරයෙන් ලද අවස්ථාව, එහි මූලධර්ම ආරක්ෂා කිරීමටත් පාඩම් උකහා ගැනීමට හා කම්කරු පන්තියේ වැඩි දියුනු කොටස් මෙන් ම සමාජවාදී බුද්ධිමතුන් එම ඉතිහාසයෙන් පුහුනු කර ගැනීමටත් අපගේ කැප වීම යලි සහතික කර ගැනීම සඳහා යොදා ගත යුතු ය. අප මේ තාක් දුර පැමිනියේ යලි ආපසු හැරීමට නො වේ. අප අද කටයුතු කරන්නේ එකට බැඳුනු ලෝක ව්‍යාපාරයක් ලෙසට ය. අප ලෝක සමාජවාදී වෙබ් අඩවිය තුලින් දිනපතා සටන් වදින්නේ ධනවාදයේ ලෝක අර්බුදය පිලිබඳ විශ්ලේෂණයක් ද හතර වන ජාත්‍යන්තරයේ ක්‍රියා මාර්ගය ද ජාත්‍යන්තර කම්කරු පන්තිය වෙත ගෙන යාමට ය.

"1953 ජාත්‍යන්තර කමිටුව පැන නංවනු ලැබූ භේදය තුලින් සියල්ල ගලා යනු ඇතැයි 50 වසරකට පෙර කිසිවෙකුටත් පූර්වාපේක්ෂා නො කල හැකිව තිබුනි. එම අරගලය තුල ක්‍රියාකාරී වූ සියල්ලන් ම පාහේ දැන් දර්ශන පථයෙන් ඉවත්ව ගොසිනි. එහෙත් ඔවුන් සටන් වැදුනු දේශපාලන මූලධර්ම වත්මන් අවධිය තුල දැවැන්ත දේශපාලන වැදගත්කමක් දරා සිටියි. මාක්ස්වාදයේ පදනම මත සැබවින් ම ලෝකයේ බලගතු දේශපාලන පක්ෂ ගොඩ නංවිය හැකි බව අප පෙන්වා දිය යුතු ය.

"මෙම සංවත්සරයේ අර්ථභාරය එය යි. මෙම සමස්ත අත්දැකීම් සම්භාරය නව සියවස කරා ගෙන යාමටත් ඒ පදනම මත අපගේ ජාත්‍යන්තර ව්‍යාපාරයේ පුලුල් ව්‍යාප්තියක් සඳහාත්, අපට ලැබී ඇති අවස්ථාවෙන් විශාල ලෙස සතුටට හා උද්දාමයට පත් වීමට සියලු අයිතියක් ම අපට ඇති බව මගේ විශ්වාසය යි."

© ලෝක සමාජවාදී වෙබ් අඩවිය